(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 383.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 අගෝස්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2652/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ප්‍රධාන නගර 25ක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, පිහිටුවා ඇති එම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රධාන නගරය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3273/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය මාර්ගවල හෝ දුම්රියවල හවුල් හිමිකාරිත්වය දැරීමේ සංකල්පයට පෞද්ගලික සමාගම් සම්බන්ධ වූයේ කවදා සිටද;

(ii) ඒ සඳහා සම්බන්ධ වූ සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) එම සමාගම්වලින් සේවය සැපයෙන ප්‍රදේශ කවරේද;

(iv) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා අය කරනු ලැබූ ගාස්තුවලට සාපේක්ෂව, එම සමාගම් විසින් අය කරනු ලබන ගාස්තු කවරේද;

(v) මෙම සේවය බාහිර සම්පත් දායකයින්ට පැවරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුව අහිමි කරගන්නා ආවස්ථික පිරිවැය කොපමණද;

(vi) මෙම ගිවිසුමේ වලංගු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3714/'13

3.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලින් අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබූ පදනම කවරේද;

(ii) ඒ අනුව පසුගිය වර්ෂ 03 ක කාලය තුළ අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා තෝරා ගන්නා ලද සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආධාරලාභීන්ගේ නම් සහ එක් එක් පුද්ගලයාට ලබා දුන් ආධාර මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3827/'13

4.

ගරු පී. හැරිසන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියතිත්තවැව මාර්ගයේ නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකර තිබේද;

(ii) එම එක් නිවසක් ඉදිකර ගැනීමට නිවාසලාභියකුට ලබා දුන් මුදල කොපමණද;

(iii) එම මුදල ලබා දුන්නේ ආධාර වශයෙන්ද; නැතහොත්, ණය මුදලක් වශයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නිවාසලාභීන්ට,

(i) ලබා දී ඇති ඉඩම් කට්ටියක වර්ග ප්‍රමාණය කවරේද;

(ii) එම ඉඩම්වල සින්නක්කර අයිතිය ලබා දී තිබේද;

(iii) පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම යෝජනා ක්‍රමයේ,

(i) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට පදිංචිය සඳහා ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට පදිංචි නොවී ඇති නිවාස සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3920/'13

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සංයුක්ත ප්‍රතිදීප්ත පහන් (CFL), ප්‍රතිදීප්ත නළ (ටියුබ් ලයිට්) සහ ජංගම දුරකථන භාවිතය විශාල ලෙස ඉහළ ගොස් ඇති බවත්;

(ii) එම උපාංග භාවිතය ඉහළයාමත් සමග පරිසරයට එක්වන රසදිය හා කැඩ්මියම් ප්‍රමාණය ඉහළ යන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉවතලන සංයුක්ත ප්‍රතිදීප්ත පහන්, ප්‍රතිදීප්ත නළ සහ ජංගම දුරකථන ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලෝකයේ දියුණු රටවල ජලයට එක්වන රසදිය හා කැඩ්මියම් පරීක්ෂා කිරීම සඳහා විශේෂිත උපකරණ භාවිතා කරන බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ එවැනි උපකරණ භාවිතා කරන්නේද;

(iii) එසේ නොමැති නම්, එවැනි උපකරණ භාවිතය හඳුන්වා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4507/'13

6\.

ගරු සුජීව සේනසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ආරම්භ කළ දින සිට මේ දක්වා එහි නඩත්තු කටයුතු වෙනුවෙන් වැය වූ මුදල කොපමණද;

(ii) හම්බන්තොට වරාය තුළින් රුපියල් මිලියන 420 ක ආදායමක් ලැබී ඇති බව සනාථ කරන්නේද;

(iii) එම වරාය ඔස්සේ වාහන ආනයනය කිරීමෙන් හා ප්‍රති අපනයනයෙන් මෙතෙක් උපයා ඇති ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරායේ කටයුතු ආරම්භ කිරීමට පෙර සියලු අපනයන හා ප්‍රති-අපනයනගත වාහන ගොඩබෑම හා නැව්ගත කිරීම සිදුකරනු ලැබුවේ කොළඹ වරායේ බවත්;

(ii) සාධාරණ හේතුවක් නොමැතිව එම කටයුතු කොළඹ වරායෙන් ඉවත් කර හම්බන්තොට වරාය වෙත ගෙන යාමෙන් වාහන ආනයනකරුවන්ට වැඩි පිරිවැයක් දැරීමට සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) හම්බන්තොට වරායට නුදුරින්, ජාත්‍යන්තර මුහුදු මාර්ගය ඔස්සේ දිනකට නැව් 400ක් පමණ යාත්‍රා කරනු ලබන්නේද;

(ii) එම නැව් අතරින් ඉන්ධන ලබා ගැනීම සඳහා හම්බන්තොට වරායට පැමිණෙන නැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4523/'13

7\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිහිටා ඇති භූමියේ රෝපණය කර ඇති සුදු හඳුන් ශාක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සුදු හඳුන් ශාක අතරින් කිසියම් සංඛ්‍යාවක් කපා ඉවත් කිරීමට කටයුතු කර තිබේද;

(iii) එසේ නම්, එම ශාක සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශාක කපා ඉවත් කිරීමේ අරමුණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ (ii) හි සඳහන් පරිදි කපා ඉවත් කරන ලද සුදු හඳුන් ශාක අලෙවි කරනු ලැබුවේද;

(ii) එසේ නම්, අලෙවි කරන ලද සුදු හඳුන් තොගයේ ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4756/'14

8.

ගරු අශෝක් අබේසිංහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද උපාධිය සමත් වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද ඩිප්ලෝමාව සමත් වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) එම සභාවේ පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කර තිබේද;

(iv) එසේ නම්, එම වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(v) 2013 වර්ෂය අවසාන වන විට ඉහත සියලු වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි ලේඛනය යාවත්කාලීන කර තිබුනේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4814/'14

9.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉටු කළ යුතු බවට අපේක්ෂා කරන පරමාර්ථයන් අනුව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4854/'14

10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2002 වර්ෂයේ සිට 2013 දක්වා එක් එක් වර්ෂය සඳහා අපනයන / දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය (අපනයන දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස) එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4866/'14

11\.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිගු කලකින් ප්‍රතිසංස්කරණය කර නොමැති යාපනයේ ජුම්මා මස්ජිඩ් මාර්ගයේ පවතින වළගොඩැලි සහිත තත්ත්වය නිසා එම මාර්ගයේ ගමන් කිරීම දුෂ්කර වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) 1868 වර්ෂයේ දී ගොඩ නගා ඇති ඉතාම පෞරාණික, යාපනය ජුම්මා මස්ජිඩ් දේවස්ථානයට පැමිණෙන බැතිමතුන්ගේ සහ නැරඹීමට පැමිණෙන අයගේ පහසුව පිණිස වහාම එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4871/'14

12\.

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) නොරොච්චෝල තාප බලාගාරයේ බිඳ වැටීම් සහ නඩත්තු කටයුතු හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දැමීම නිසා ජාතික විදුලිබල පද්ධතියට මේ දක්වා අහිමි වූ විදුලි ධාරිතාවය කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 පෙබරවාරි 13 වැනි දින නොරොච්චෝල තාප බලාගාරයේ කන්ඩෙන්සර් පද්ධතියට ලුණු හෝ ඒ හා සමාන කිසියම් රසායනික ද්‍රව්‍යයක් එකතු කර ඇති බවට ඉදිරිපත් වූ ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව මේ වන විට සිදු කර ඇති පරීක්ෂණ කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයෝ කවුරුන්ද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4953/'14

13\.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ, තෝප්පුතොට සිට දන්කොටුව, නාත්තන්ඩිය හරහා මහවැව දක්වා මාර්ගයේ දුර ප්‍රමාණය කොපමණද;

(ii) එම මාර්ගය ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(iii) එම මාර්ගය ඉදිකිරීම සිදු කරනු ලබන සමාගම කවරේද;

(iv) එම සමාගමට ඉදිකිරීම පැවරීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගයේ ඉදිකිරීම් අරඹන ලද දිනය කවරේද;

(ii) මෙම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කිරීමේ ඉලක්ක ගත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4963/'14

14.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ උපාධි පාඨමාලාව සඳහා බඳවා ගන්නා ශිෂ්‍යයින් සංඛ්‍යාව අඩු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම උපාධි පාඨමාලාව ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) පාඨමාලාව හැදෑරීම සඳහා එක් වර්ෂයකට බඳවා ගැනීමට තීරණය කර ඇති අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වර්ෂයේ දී කළමනාකරණ උපාධිය සඳහා බඳවා ගත් අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු ජානක වක්කුඹුර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සත්මෙත්සිත්හවුල සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ

වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය

කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

වසන්ත සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

ලංකාවේ රෝමානු කතෝලික අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

19.

ජෝන් සෙනෙවිරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**